# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2347/14 – 2023 අගෝස්තු මස 31 වැනි බ්‍රහස්පතින්දා – 2023.08.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස – පළාත් පාලනය

## පළාත් පාලන නිවේදන

### ගාල්ල මහා නගර සභාව

විනෝද බද්ද

(267 වන අධිකාරය වන) විනෝද බදු ආඥාපනතේ දෙවන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව ගාල්ල දිස්ත්‍රික්කයේ ගාල්ල මහා නගර සභාව විසින් 2022.04.11 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ තීරණ අංක 06 (02) යටතේ සම්මත කරන ලද පහත යෝජනාව 1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ දෙවන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු විනෝද බදු ආඥාපනතේ දෙවන වගන්තියේ (2) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව දකුණු පළාතේ, ආණ්ඩුකාරවර, ඩබ්ලිව්. ඩබ්ලිව්. ගමගේ වන මා විසින් අනුමත කරන ලද බව මෙයින් කාරුණිකව නිවේදනය කරනු ලැබේ.

ඩබ්ලිව්. ඩබ්ලිව්. ගමගේ,
දකුණු පළාත් ආණ්ඩුකාරවර.

2023 අගෝස්තු මස 16 වැනි දින,
ගාල්ල,
ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේ දී ය.

**යෝජනාව**

267 වන අධිකාරය වන විනෝද බදු ආඥාපනතේ දෙවන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව ගාල්ල මහා නගර සභාව, සභාවේ පරිපාලන සීමා ඇතුළත වූ ප්‍රදේශයෙහි පවත්වනු ලබන එකී ආඥාපනතේ විස්තර කර ඇති යම් විනෝද කටයුත්තකට (අදාළ විනෝද කටයුත්ත) කරනු ලබන ගෙවීමකින් පහත දක්වා ඇති ආකාරයට බද්දක් වශයෙන් පනවා අයකළ යුතු යැයි ද, මෙම යෝජනාව *ගැසට් පත්‍රයේ* පළවන දින සිට ක්‍රියාත්මක විය යුතු යැයි ද, යෝජනා කරන්නීය. එසේම පනවන ලද විනෝද බද්ද එකී විනෝද කාර්යය පවත්වන දිනට පෙර අදාළ සංවිධායක හෝ සංවිධායකවරු විසින් නිසි ලෙස ගාල්ල මහා නගර සභාවට ගෙවිය යුතු බවටත්, ගාල්ල මහා නගර සභාව වැඩිදුරටත් යෝජනා කරන්නීය.

| *කාර්යය* | *විනෝද බදු ප්‍රතිශතය* |
|---|---|
| 1. ජාත්‍යන්තර ක්‍රිකට් තරගාවලි සඳහා | 25% |
| 2. චිත්‍රපට සංස්ථාවේ ලියාපදිංචි සිනමා ශාලා සඳහා | 15% |
| 3. නීතියෙන් නිදහස් කර ඇති කාර්යයන් හැර අනෙකුත් සියලු විනෝද බදු අයකළ යුතු කාර්යයන් සඳහා | 20% |

EOG 08 - 0296

1A – PG 6467 – 07 (2023/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*